# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1782/40 - 2012 නොවැම්බර් මස 02 වැනි සිකුරාදා - 2012.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**කුරුඳු කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥා පණතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2012 නොවැම්බර් මස 23 දින මධ්‍යාහ්න 12.00 දක්වා, එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක් ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතා දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1959 අප්‍රේල් මස 29 වන දින අංක 11732 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1664/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද දැන්වීම්වලින් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලේඛනයේ II කොටස වෙනුවට පහත කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කල යුතු ය.

1A - G 016845— 345 (2012/112)

II කොටස

I තීරයෙන් දැක්වෙන නිශ්චිත කැලි මිම්මේ හා කාල මිම්මේ වැඩ ප්‍රමාණයන් ට අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II තීරයෙහි දක්වා ඇති අනුරූප ප්‍රමාණයෙන් විය යුතු ය.

| *I වැනි තීරය*<br>*විස්තරය* | *II වැනි තීරය*<br>*අවම වේතන ප්‍රමාණය*<br>*රු. ශත.* |
|---|---|
| **කාල මිම්මේ වැටුප් - දෛනික :** | |
| නුහුරු පැහීම, අගල් දැමීම හා තට්ටු සකස් කිරීම, වල් නෙලීම, ඉලුක් තණ ඉවත් කිරීම හා මායිම් එළි කිරීම (එක් දිනකට) | |
| පිරිමි/ගැහැණු කම්කරුවෙකුට | 700.00 |
| **කුරුඳු තැලීම - දෛනික :** | |
| පිරිමි/ගැහැණු කම්කරුවෙකුට | 1,000.00 |
| **කැලි මිම්මේ වැටුප් - ඒකකයකට :** | |
| නුහුරු පැහීම - හෙක්ටයාරකයට | 12,500.00 |
| අගල් දැමීම - 18" X 18" කාණු දිග මීටර් 10ට | 275.00 |
| වාර්ෂික වල් නෙලීම - හෙක්ටයාරයකට | 17,500.00 |

11 - 717/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ඉස්සන් බෝ කිරීමේ සහ පිට රට යැවීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීමට තමන් අදහස් කරන බව ඉස්සන් බෝ කිරීමේ සහ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් එම ආඥා පණතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණයන් ට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2012 නොවැම්බර් මස 23 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා, එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක් ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශනයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
ඉස්සන් බෝ කිරීමේ සහ පිටරට යැවීමේ කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

ඉස්සන් බෝ කිරීමේ සහ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1999 අප්‍රේල් මස 04 වන දින අංක 1073/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, අවසන් වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1664/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ උපලේඛනයට පහත සඳහන් කොටස ඇතුලත් කිරීමෙන් වෙනස් කල යුතු ය.

ඉස්සන් බෝ කිරීමේ සහ පිටරට යැවීමේ කර්මාන්තයෙහි නියුක්ත I වන කොටසේ සඳහන් විවිධ ශ්‍රේණි යටතේ දැක්වෙන කම්කරුවන් ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම මාසික ඒකාබද්ධ වේතන ප්‍රමාණය II කොටසෙහි එම ශ්‍රේණියට අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතු ය.

***I** වන කොටස*

සේවකයන්ගේ පන්තිය

පුහුණු :

මේසන්වරු, වඩුවෝ, ජලය සපයන්නෝ සහ ටැංකිවලින් ජලය පිට කරන්නෝ. පොම්පාගාර පාලකයෝ සහ පොම්පකරුවෝ, ජලය සංසරණය සිදුකරන්නෝ, ඔක්සිජන් සපයන්නෝ, උෂ්ණත්වය පාලනය කරන්නෝ, කෑම විටමින් වර්ග සහ ඖෂධ සපයන්නෝ, සත්ව ආහාර නිකුත් කරන කම්කරුවන්/ගබඩා කරුවෝ, අස්වැන්න බාර ගන්නා අය/ගබඩා කරුවෝ, හරි වැරදි බලන්නෝ, හා තත්ත්ව පාලකවරු, කපන්නෝ, සෝදන්නෝ. ඉස්සන් වර්ග කරන්නෝ. හරි වැරදි බලන්නෝ, ටැංකි සෑදීමේ යෙදෙන කම්කරුවෝ, අස්වැන්න එකතු කරන්නෝ, බෝට්ටු පදවන්නෝ, පැකට්වලට අසුරන්නෝ, ශීත කාමරවල තැන්පත් කරන්නෝ.

අර්ධ පුහුණු :

භූමිය සකස් කරන කම්කරුවෝ, ටැංකි මුරකරුවෝ සහ භාරකරුවෝ, ලුණු ඇදීම කරන්නෝ, මුද්‍රා තබන්නෝ, සෙලෝපේන් සහ කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, ගල්වැටි දැමීම සහ අඩි පාරවල් සාදන්නෝ.

නුපුහුණු :

ටැංකි පවිත්‍රකරන්නෝ, ටැංකි සතුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා නියැලෙන කම්කරුවෝ, ශීත කාමර ශුද්ධ කරන්නෝ සහ අමදින්නෝ, ඉහත දැක්වෙන ඡේදවල ඇති වැඩවලට සම්බන්ධ වූ හෝ අනියම් වශයෙන් ගැනෙන යම් කාර්යයක නිරත වූ කම්රුවෝ.

* 1945 නොවැම්බර් මස 02 වැනි දින අංක 9481 දරන *ගැසට් පත්‍රයේ පළවූ* ආඥාවෙහි නියමිත මෝටර් රථ ගමනාගමන කර්මාන්තයේ නියුක්ත කම්කරුවෝ - ඒ කර්මාන්තයේ නිර්දේශිත අනුව වරප්‍රසාද හා ගෙවීම් ලැබිය යුතු ය.

* 1944 ජනවාරි මස 07 වැනි දින අංක 9224 දරන *ගැසට් පත්‍රයේ පළවූ* සහ අනතුරුව සංශෝධනය කරන ලද ආඥාවෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයේ නියුක්ත කම්කරුවෝ - එම කර්මාන්තයේ නිර්දේශිත වරප්‍රසාද හා ගෙවීම් ලැබිය යුතු ය.

* පහත සඳහන් සේවකයන් මෙම පඩිපාලක සභා තීරණවලින් ආවරණය නොවේ.
ලිපිකරුවෝ, කැෂියර්වරු, වේලා සටහන්කරුවෝ, මුරකරුවෝ

II වන කොටස

වැඩ කරන මාසයක් සඳහා වූ අවම වේතන ප්‍රමාණය

| *සේවා වසර* | *පුහුණු රු. ශත* | *අර්ධ පුහුණු රු. ශත* | *නුපුහුණු රු. ශත* |
|---|---|---|---|
| 1 වසර | 10,400.00 | 9,920.00 | 9,500.00 |
| 2 වසර | 10,550.00 | 10,045.00 | 9,600.00 |
| 3 වසර | 10,700.00 | 10,170.00 | 9,700.00 |
| 4 වසර | 10,850.00 | 10,295.00 | 9,800.00 |
| 5 වසර | 11,000.00 | 10,420.00 | 9,900.00 |

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් මෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බැව් එකී පඩිපාලක සභා ආඥා පණතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා වර්ෂ 2012 නොවැම්බර් මස 23 දින මධ්‍යාහ්න 12.00 දක්වා, මෙම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක් ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරන ලදුව, 1999 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 1099/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2010 අගෝස්තු 27 වැනි දින අංක 1668/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලැබූ තීරණ, එම උපලේඛනයට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කල යුතුය.

***සේවකයන්ගේ පංතිය***

පුහුණු :

අංශ නියාමකයින්, විවිධ යන්ත්‍ර ක්‍රියා කරවන්නන් මෝස්තර අඳින්නන්, චාර්ජ් හැන්ඩ්ර්වරුන්, දහන යන්ත්‍ර ක්‍රියාකරුවන්, උඳුන් ක්‍රියා කරවන්නන්, ජ්‍යෝෂ්ඨ ලිෆ්ට් ඔපරේටර්, අච්චු ශිල්පීන්, පර්යේෂණ සහයකයන්, මූර්ති ශිල්පීන්, චිත්‍ර ශිල්පීන්, හරි වැරදි බලන්නන්, විදුලි කාර්මිකයින්.

අර්ධ පුහුණු :

සහකාර අච්චු ශිල්පීන්, වර්ණ ගන්වන්නන් (ස්ප්‍රේ කරන්නන් සහ ඩීපර්ස්) තෝරන්නන්, කණිෂ්ට ලිෆ්ට් ඔපරේටර්, පොලිෂ් කරන්නන්. අසුරන්නන්, නිෂ්පාදන සුද්ද කරන්නන්, ස්ටිකර් අලවන්නන්, ෂවල් ලෝඩර් ඔපරේටර්, සහකාර යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි උත්පාදක යන්ත්‍ර ක්‍රියාකරු, උඳුන් සහායක ක්‍රියාකරු.

නුපුහුණු :

පිරිසිදු කරන්නන්, අත් උදවුකරුවන්, සාමාන්‍ය වැඩකරුවෝ, වතුවැඩ කරන්නන් සහ වෙනත් ආනුශංගික සේවාවල නිරතවන්නන්.

ආධුනිකයින් :

අවුරුදු දෙකක පුහුණු කාල සීමාවකට යටත් ව විවිධ කාර්යයන්හි වැඩ ඉගෙන ගන්නා අය.

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| සේවා වසර | පුහුණු<br>රු. ශත | අර්ධ පුහුණු<br>රු. ශත | නුපුහුණු<br>රු. ශත | ආධුනිකයින්<br>රු. ශත |
|---|---|---|---|---|
| 1 වසර | 10,300.00 | 9,600.00 | 8,970.00 | 5,460.00 |
| 2 වසර | 10,450.00 | 9,725.00 | 9,070.00 | 5,560.00 |
| 3 වසර | 10,600.00 | 9,850.00 | 9,170.00 | |
| 4 වසර | 10,750.00 | 9,975.00 | 9,270.00 | |
| 5 වසර | 10,900.00 | 10,100.00 | 9,370.00 | |

11 - 717/3

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥා පණතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය පිළිබඳව දැක්වෙන විරුද්ධතාවයන් 2012 නොවැම්බර් මස 23 දින මධ්‍යාහ්න 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක් ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 2003 මාර්තු මස 12 වැනි දින අංක 1279/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද සහ අවසන් වරට 2010 ජුනි 30 දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ තීරණ පහත දැක්වෙන පරිදි එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

***II* වැනි කොටස**

ගල්කොරි හා කළුගල් කැඩීමේ කර්මාන්තයේ නියුක්ත පහත දැක්වෙන පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ වන අවම මාසික වේතන ප්‍රමාණය පහත වගුවෙන් දැක්වෙන පරිදි විය යුතු ය.

පුහුණු :

කළුගල් අතින් විදින්නන්, කළුගල් යාන්ත්‍රිකව විදින්නන්, බෝරවල වෙඩි බෙහෙත් පුරවන්නන්, ගිනි තැබීමෙන් බෝර පුපුරවන්නන්, බැටරි විදුලි බලය මගින් බෝර පුපුරවන්නන්.

අර්ධ පුහුණු :

අතින් ගල් කැබලි කරන්නන්, යන්ත්‍රවලින් ලොකු ගල් කුඩා ගල්වලට කඩන්නන්, කළුගල් යන්ත්‍ර මගින් ලොරිවලට පුරවන්නන්, මෙටල් ක්‍රෂර් යන්ත්‍ර මගින් කළුගල් විවිධ ප්‍රමාණවලට කඩන්නන්, කැඩූ කළුගල් කැබලි යන්ත්‍ර මගින් ඉවත් කරන්නන්, කළුගල් කැබලි යන්ත්‍ර මගින් ගොඩගසන්නන්, කළුගල් කැබලි යන්ත්‍ර මගින් ලොරිවලට පටවන්නන්.

නුපුහුණු :

සක්කා ගල් එකතු කරන්නන්, කළුගල් අතින් ලොරිවලට පටවන්නන්, කැඩූ කළුගල් කැබලි අතින්/විල්බරෝ මගින් ඉවත් කරන්නන්, කළුගල් කැබලි ගොඩගසන්නන්, ඉහත දැක්වෙන සියලුම වැඩවලට සම්බන්ධිත වූ හෝ ඊට අනුෂාංගික වූ කටයුතු කරන්නන්.

මාසික අවම වේතන ප්‍රමාණය

| *සේවා වසර* | *පුහුණු රු. ශත* | *අර්ධ පුහුණු රු. ශත* | *නුපුහුණු රු. ශත* |
|---|---|---|---|
| 1 වසර | 12,500.00 | 11,750.00 | 11,000.00 |
| 2 වසර | 12,650.00 | 11,875.00 | 11,100.00 |
| 3 වසර | 12,800.00 | 12,000.00 | 11,200.00 |
| 4 වසර | 12,950.00 | 12,125.00 | 11,300.00 |
| 5 වසර | 13,100.00 | 12,250.00 | 11,400.00 |

11 - 717/4

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥා පණතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2012 නොවැම්බර් මස 23 දින මධ්‍යාහ්න 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක් ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
පුවත්පත් කලාවේදී කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1986 ජූලි මස 25 වැනි දින අංක 411/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, අවසන් වරට අංක 1660/35 දරන 2010 ජූනි 30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

***II වැනි කොටස***

විශේෂ ශ්‍රේණිය

නියෝජ්‍ය කර්තෘ, සම කර්තෘ, විශේෂ ශ්‍රේණියේ කර්තෘ, කර්තෘ (දිනපතා).

I වන ශ්‍රේණිය

ව්‍යාපාරික කර්තෘ, ප්‍රධාන උප කර්තෘ, විශේෂාංග ප්‍රධානීන්, විදේශීය ප්‍රවෘත්ති කර්තෘ, විචිත්‍රාංග කර්තෘ, ප්‍රාදේශීය ප්‍රවෘත්ති කර්තෘ, ප්‍රවෘත්ති කර්තෘ, ක්‍රීඩා කර්තෘ, කාන්තා පිටු සංස්කාරිකා, කාර්තෘ (සතිපතා) චිත්‍ර කතා කර්තෘ.

II වන ශ්‍රේණිය

සහකාර කර්තෘ, ප්‍රධාන කැමරා ශිල්පීන්, විශේෂාංග නියෝජ්‍ය අංශ ප්‍රධානීන්, විශේෂාංග ලියන්නන්, සහකාර කතුවැකි රචකයින්, පුස්තකාලයාධිපතීන්, උප කර්තෘ, විකට චිත්‍ර ශිල්පීන්, භාෂා පරිවර්තකයින්, ජ්‍යෙෂ්ඨ කැමරා ශිල්පීන්, චිත්‍ර ශිල්පීන්.

III වන ශ්‍රේණිය

සහකාර පුස්තකාලයාධිපතින්, වාර්තාකරුවන්, කැමරා ශිල්පීන්, කණිෂ්ඨ උප කර්තෘ, සෝදුපත් කියවන්නන්.

මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| *සේවා වසර* | *විශේෂ ශ්‍රේණිය රු. ශත* | *I ශ්‍රේණිය රු. ශත* | *II ශ්‍රේණිය රු. ශත* | *III ශ්‍රේණිය රු. ශත* |
|---|---|---|---|---|
| 1 වසර | 19,580.00 | 16,070.00 | 15.055.00 | 14,235.00 |
| 2 වසර | 19,930.00 | 16,370.00 | 15,305.00 | 14.435.00 |
| 3 වසර | 20,280.00 | 16,670.00 | 15,555.00 | 14,635.00 |
| 4 වසර | 20,630.00 | 16,970.00 | 15,805.00 | 14,835.00 |
| 5 වසර | 20,980.00 | 17,270.00 | 16,055.00 | 15,035.00 |
| 6 වසර | 21.330.00 | 17,570.00 | 16,305.00 | 15,235.00 |
| 7 වසර | 21,680.00 | 17,870.00 | 16.555.00 | 15,435.00 |
| 8 වසර | 22,030.00 | 18,170.00 | 16,805.00 | 15,635.00 |
| 9 වසර | 22,380.00 | 18,470.00 | 17,055.00 | 15,835.00 |
| 10 වසර | 22,730.00 | 18,770.00 | 17,305.00 | 16,035.00 |
| 11 වසර | | 19,070.00 | 17,555.00 | 16,235.00 |
| 12 වසර | | 19,370.00 | 17,805.00 | 16,435.00 |
| 13 වසර | | 19,670.00 | 18,055.00 | 16,635.00 |
| 14 වසර | | 19,970.00 | 18,305.00 | 16,835.00 |
| 15 වසර | | 20,270.00 | 18,555.00 | 17,035.00 |

III වන ශ්‍රේණියේ පුහුණුවන්නන් පළමු වසර - රු. 9,460.00

11 - 717/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.